# නෙස්ලේ ශ්‍රී ලංකාවේ කිරි එකතු කිරීම ඉහළ නංවා ඇති අතර දේශීය කිරි කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා දී ඇති ප්‍රතිඥාව තව දුරටත් තහවුරු කරයි

ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ විශාලතම කිරි එකතු කරන සමාගම වන නෙස්ලේ ලංකා 2012 ජනවාරි - අප්‍රේල් අතර කාලය තුළ දේශීය නැවුම් කිරි එකතු කිරීම 45%කින් ඉහළ නංවන ලද බව නිවේදනය කරයි.

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයේ විශාල ඉහළ යාමක් වාර්තා වීමද සමගින් එම සැලකිය යුතු ඉහළ යාමට මුහුණ දීම සඳහා නෙස්ලේ සමාගම තම නැවුම් කිරි එකතු කිරීමේ කාර්යාවලිය 2012 වසරේ මුල් සිව් මස තුළ ඉහළ නැංවීමට කටයුතු කරන ලදි.

"අපේ නැවුම් කිරි එකතු කිරීමේ කාර්යාවලිය ඉහළ නංවා ඇති නිසා කුරුණෑගල පිහිටි අපේ කර්මාන්තශාලාව මේ වන විට උපරිම ධාරිතාවයෙන් නිෂ්පාදන කටයුතු සිදුකරන අතර අපේ දේශීය කිරි ගොවීන්ට සහාය පළ කිරීම සඳහා නොකඩවා හැකි තරම් කිරි මිලදී ගැනීම සිදු කරනවා. ඒ වගේම නැවුම් කිරි නිෂ්පාදන කටයුතුද උපරිම ධාරිතාවයෙන් අඛන්ඩව සිදු කරනු ලබනවා." මේ පිළිබඳව තම අදහස් දක්වමින් නෙස්ලේ ලංකා PLC හි කළමණාකාර අධ්‍යක්ෂ ඇලොයිස් හොෆ්බාර් මහතා පැවසීය.

'සාමූහික සාරධර්ම නිර්මාණකරනය' යන සංකල්පය ඔස්සේ තම ව්‍යාපාර කටයුතුවල නිරතවන නෙස්ලේ සමාගම තමන් මෙහෙයුම් කටයුතු සිදුකරන ප්‍රජාවන්ගේ ජනතාවට අන්‍යොන්‍ය ප්‍රතිලාභ අත්පත් කරදීම සඳහා දැඩි කැපවීමකින් කටයුතු කරනු ලබයි. ග්‍රාමීය සංවර්ධනය, තම සමාගමට සහ පොදුවේ සමාජයට 'සාමූහික සාරධර්ම නිර්මාණකරනය' සඳහා මූලික ආධාරකයක් ලෙස සලකන නෙස්ලේ, ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ ලා ප්‍රධාන භූමිකාවක නිරතව සිටී.

සමාගම ශ්‍රී ලංකාවේ කිරි ක්ෂේත්‍රයට උපකාර කිරීමෙහි වසර 1980 සිට නිරතව සිටින අතර ගවයින්ට ආහාර ලබාදීම සහ බෝ කිරීම, සතුන්ගේ සෞඛ්‍ය සහ සත්ව ගොවිපල කළමනාකරණය, ආදී උසස් තත්වයේ කිරි ගොවි ක්‍රියා කාරකම් ප්‍රවර්ධනය සඳහා  කිරි ගොවීන් හා රජය සමග වසර ගණනාවක සිට එක්ව සිටී. එසේම නෙස්ලේ සමාගම වැඩි දුරටත් අත්‍යවශ්‍ය උපකරණ සැපයීම, ඖෂධ සහ සහනාධාර ලබාදීම ආදිය ඔස්සේ කිරි ගොවීන්ට උපකාර කරනු ලබයි.

නෙස්ලේ ලංකා සමාගම ඉතා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ දේශීය නැවුම් කිරි එකතු කිරීමට පහසුකම් සැලසීම සඳහා කිරි ශීත කිරීමේ හා එකතු කිරීමේ මධ්‍යස්ථාන ජාලයක්ද දිවයින පුරා පිහිටුවා තිබේ.

මීට අමතරව නෙස්ලේ ලංකා සමාගම "නැගෙනහිර නවෝදය" සහ "උතුරු වසන්තය" වැඩසටහන් අනුව පෙළ ගැසෙමින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල

සංවර්ධනයට උර දීමක් ලෙස එම ප්‍රදේශවලින් හැකිතාක් නැවුම් කිරි එකතු කිරීමට විශේෂ ප්‍රයත්නයක් දරනු ලබයි. සමාගම විසින් මේ සඳහා යාපනය, කිලිනොච්චි සහ ඔඩ්ඩුසුඩාන් යන ප්‍රදේශවල කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර ඒවා වසර 30 ක කාලයකට පසු එම ප්‍රදේශවල විවෘත කරන ලද ප්‍රථම කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන වේ.

දේශීය කිරි කර්මාන්තය සඳහා දක්වන ලද අපරිමිත දායකත්වය වෙනුවෙන් ගෞරවයට පාත්‍ර වූ සමාගම 2010 වසරේදී ස්වාධීන ජනමාධ්‍යකරුවන්ගේ සංවිධානය වෙනුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක චමල් රාජපක්ෂ මහතා අතින් "ස්වර්ණ ලංකා" සම්මානයෙන් පිදුම් ලැබීය.

"දේශීය කිරි කර්මාන්තයේ තිරසාර බව අපේ ප්‍රමුඛතම අරමුණක්. කිරි මිලදී ගැනීම ඔස්සේ පමණක් පසුගිය වසරේ අප ග්‍රාමීය ආර්ථිකය සඳහා දායක කරන ලද මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 2කට අධිකවන අතර 2012 වසරේත් ග්‍රාමීය ආර්ථිකය සඳහා ඒ අයුරින්ම දායක වීමට අපේක්ෂා කරනවා." හොෆ්බාර් මහතා අවසන් වශයෙන් පැවසීය.